අතුරුදහන්වීම් වලින් මාධ්‍ය නිදහස් කරනු

ප්‍රගීත් එක්නැළිගොඩ, ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ 'ලංකාඉනිවුස්' ආයතනයේ ප්‍රධාන දේශපාලන වාර්තාකරුවෙක් හා කාටූන් චිත්‍රශිල්පියෙක්වූ ප්‍රගීත් එක්නැළිගොඩ 2010 ජනාධිපතිවරණයට දින කීපයකට පෙර 2010 ජනවාරි මාසයේදී අතුරුදහන් විය. ඔහුගේ සගයන් එක්නැළිගොඩ හඳුන්වා දෙන්නේ නිතර රජය විවේචනය කළ දේශපාලන විශ්ලේෂකයෙක් ලෙසයි. කම්කරු අයිතීන් හා වාර්ගික සමානතාව ඇතුළු මානව හිමිකම් ප්‍රශ්න ගැන ඔහු නිතර ලිපි පළකළේය.

ඔහු දුන් අවසාන දුරකථන පණිවුඩයට අනුව ඒ වන විට ඔහු මිතුරෙක් සමග කොළඹ නගරාසන්න ප්‍රදේශයක වාහනයකින් ගමන් කරමින් සිට ඇත. පසුවදා ඔහුගේ බිරිඳ, ඔහු අතුරුදහන්වී ඇති බව හෝමාගම පොලීසියට පැමිණිලි කළාය. එදිනම සවස 'ලංකාඉනිවුස් 'ආයතනයද මේගැන පොලීසියට පැමිණිලි කළේය.2010 ජනවාරි 25 වැනිදා විමර්ශනයක් ආරම්භ කරන ලදී. අද වන තුරු මේ සම්බන්ධයෙන් කිසිවෙක් අත්අඩංගුවට ගෙන නැත. 2011 නොවැම්බර් මාසයේ වදහිංසා පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටු සැසියක් ඇමතූ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය මණ්ඩල උපදේශකයෙක් හා හිටපු නීතිපති වන මොහාන් පීරිස් ප්‍රකාශ කළේ එක්නැළිගොඩ ජීවතුන් අතර බවත් රහසේ ලංකාවෙන් නික්ම ගොස් ඇති බවත්ය.

පසුගිය වර්ෂයේ, අභියාචනාධිකරණය එක්නැළිගොඩ පිළිබඳව විමර්ශනය කරන ලෙස හෝමාගම මහේස්ත්‍රාත්වරයාට නියෝග කළේය. 2012 අප්‍රියෙල් 24 වැනිදා එක්නැළිගොඩ පිළිබඳ නඩුව අභියාචනාධිකරණයට ඉදිරිපත් කෙරුණි. පීරිස්ගේ ප්‍රකාශය සාක්ෂියක් ලෙස පිළිගත යුතුද යන්න පිළිබඳව මහේස්ත්‍රාත් උසාවිය මැයි 17 වැනිදා තීරණය කිරීමට නියමිතය. එම නඩුව නැවතත් මැයි 31 වැනිදා අභියාචනාධිකරණය ඉදිරියේ විභාගයට ගැනෙනු ඇත.

එක්නැළිගොඩ 2009 ද හඳුනා නොගත් පුද්ගලයන් විසින් පැහැරගන්නා ලද නමුත් පසුවදා නිදහස්කරන ලදී. එක්නැළිගොඩගේ පවුල ඔහු පිළිබඳ තොරතුරක් බලාපොරොත්තුවෙන් පසුවන අතර මේ සම්බන්ධයෙන් සාධාරණයක් ඉටුකරවා ගැනීමට වෙහෙසෙයි.

ප්‍රගීත් එක්නැළිගොඩගේ අතුරුදහන් වීම පිළිබඳව විශ්වාසනීය විමර්ශනයක් කරන ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු. මාධ්‍යවේදීන් බියගැන්වීම හා ඔවුන්ට පහරදීම් පිළිබඳව දඬුවම් නොකිරීමේ පිළිවෙත අවසන් කිරීම ඇතුළු හිංසාවට හා වද දීමට ලක්වීමේ බියෙන් තොරව ස්වාධීනව මාධ්‍යවේදීන්ට කටයුතු කළ හැකි වාතාවරණයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසද අපි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු.